සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# දෙවන වාර පරීක්ෂණය 2018

**10 ශ්‍රේණිය** **බුද්ධ ධර්මය - I** **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
- 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

01. උපශාන්ත පැවිදි රුව ගැනම සිත යොමු කරමින් සිටි බෝසතුන්ට මාලිගයෙන් ලද පණිවිඩය වන්නේ,
    (1) පිය රජ ගිලන් වී ඇති බව ය.
    (2) යසෝධරා දේවිය පුතකු ලද බව ය.
    (3) මහා ප්‍රජාපතී ගෝතමිය අමතන බව ය.
    (4) විවාහය සඳහා ප්‍රදර්ශනයක් තැබිය යුතු බව ය.

02. මෙවැනි ස්වාමියෙක් ඇති බිරිඳ ද නිවීම ලැබ සිටින්නියකි, යන්නෙන් ප්‍රකාශ කළේ,
    (1) කිසා ගෝතමී ය. (2) මහා ප්‍රජාපතී ගෝතමී ය.
    (3) විශාඛා මහා උපාසිකාවෝ ය. (4) ඛේමා බිසව ය.

03. පිංකම් මගින් බෞද්ධයා බලාපොරොත්තු විය යුත්තේ,
    (1) නිවන් යෑමට ය.
    (2) දෙව් ලොව යෑමට ය.
    (3) සැපසම්පත් පරලොවදී ලබා ගැනීමට ය.
    (4) අකුසල් මුල්, ක්‍රමයෙන් තුනී කර ගැනීමට ය.

04. තෙරුවන් සරණ යෑම දෙවියෙකු බ්‍රහ්මයෙකු හෝ ගැලවුම්කරුවෙකුගෙන් පිහිට පැතීමට වඩා හාත්පසින් ම වෙනස් වූවකි. එහි පදනම වන්නේ,
    (1) භක්තිය ය. (2) විශ්වාසය ය.
    (3) ශ්‍රද්ධාව ය. (4) ඇදහීම ය.

05. ධර්ම රත්නයේ ගුණයක් ලෙස දැක්වෙන්නේ,
    (1) අකාලිකෝ ගුණයයි. (2) විජ්ජාචරණ ගුණය යි.
    (3) ලෝකවිදූ ගුණයයි. (4) දක්ඛිණෙය්‍යෝ ගුණයයි.

06. බුදු දහමේ ''ඉන්ද්‍රිය සංවරය'' යනු,
    (1) හිඳීම, සිටීම, ඇවිදීම ආදී ක්‍රියාවන් ය.
    (2) ලද දෙයින් සතුටු වීම ය.
    (3) ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස යන ඉන්ද්‍රිය සංවරයයි.
    (4) සියලු ක්‍රියාවන් අවධානයෙන් කිරීම.

07. ''චිත්තං සමේතීති සමථෝ'' යන්නෙහි අදහස තෝරන්න.
    (1) කය සන්සුන් කරන්නේ සමථයයි. (2) ප්‍රඥා වර්ධනය කරන්නේ සමථයයි.
    (3) නිවන් පසක් කරන්නේ සමථයයි. (4) සිත සන්සුන් කරන්නේ සමථයයි.

08. ''කර්මස්ථාන'' ප්‍රමාණය සංඛ්‍යාවෙන්
    (1) 41 කි. (2) 40 කි. (3) 42 කි. (4) 45 කි.

09. ''සඤ්ඤා'' ස්කන්ධය යනු,

(1) වින්දනය විඳීම ය. (2) සිත තුළ උපදින සටහන් නිමිති ය.

(3) ශරීරය, කය, භෞතික සැකැස්ම ය. (4) චේතනා, රැස් කිරීම ය.

10. දුටුගැමුණු රජතුමා අයත් රාජ පෙළපත වන්නේ,

(1) රුහුණු රජ පෙළපතට ය. (2) මෞර්ය රජ පෙළපතට ය.

(3) කන්ද උඩරට රජ පෙළපතට ය. (4) ලම්බකරණ රජ පෙළපතට ය.

11. උට්ඨානවතෝ යනු,

(1) දැහැමිව ජීවත් වීමයි. (2) පිරිසිදුව කටයුතු කිරීමයි.

(3) එළඹසිටි සිහියයි. (4) නොපසු බස්නා වීර්යයි.

12. සිල් රැකීමෙන් ලැබෙන ආනිසංස පහට අයත් නොවන කරුණ තෝරන්න.

(1) මහත් වූ භෝග සම්පත් අත්පත් කර ගැනීම.

(2) කීර්තිය පැතිරීම.

(3) නිවන් සැප ලැබීම.

(4) මරණින් මතු සුගතියෙහි උපත ලැබීම.

13. උදෑසන සය දිසාවට නමස්කාර කරමින් සිටි තරුණයා වන්නේ,

(1) සුනීත තරුණයා ය. (2) සිගාල තරුණයා ය.

(3) වස්සකාර තරුණයා ය. (4) සෝපාක තරුණයා ය.

14. සිගාලෝවාද සූත්‍රයට අනුව සමාජය සය ආකාරය. ඒ අනුව පහත දැක්වෙන සමාජයන්හි නොගැළපෙන වරණය තෝරන්න.

(1) දකුණු දිසාව - මිත්‍රයන් (2) නැගෙනහිර දිසාව - මව් පියන්

(3) බස්නාහිර දිසාව - පුත්‍ර දාරාවන් (4) යට දිසාව - සේවක සේවිකාවන්

15. බුදුරජාණන් වහන්සේගෙන් ''ඔබ දෙවියෙක් ද, ගාන්ධර්වයෙක් ද, යක්‍ෂයෙක් ද, මනුෂ්‍යයෙක්'' දැයි විමසූ බමුණා වූයේ,

(1) කොණ්ඩඤ්ඤ බමුණා ය. (2) මාගන්දි බමුණා ය.

(3) පොට්ටපාද බමුණා ය. (4) ද්‍රෝණ බමුණා ය.

16. බුදු දහම ''පටිසෝතගාමී'' ය. එනම්,

(1) යටිගම් බලා ගමන් කිරීම ය. (2) උඩුගම් බලා ගමන් කිරීම ය.

(3) පිළිවෙලකට ගමන් කිරීම ය. (4) පිළිවෙතකට ගමන් කිරීම ය.

17. ''වැරදි බහුල සමාජයක නිවැරදි ජීවිතයක් ගත කිරීම'' හැඳින්වෙන්නේ,

(1) සාමකාමී ජීවිතය ලෙස ය. (2) ගුණගරුක ජීවිතය ලෙස ය.

(3) පද්මාකාර ජීවිතය ලෙස ය. (4) ශ්‍රද්ධා ජීවිතය ලෙස ය.

18. තමා උපමා කොට අනුන් ගැන සිතන්නට බුදු දහම නිරන්තරයෙන් උපදෙස් දෙයි. එම හැසිරීම හැඳින්වෙන්නේ,

(1) උට්ඨාන වීර්යය යනුවෙනි. (2) සාරධර්ම ලෙස ය.

(3) අත්තූපනායික ධර්ම පරියාය ලෙස ය. (4) හිරි ඔත්තප්ප හෙවත් දේව ධර්මය ලෙස ය.

19. බුදුරජාණන් වහන්සේ කිසි විටෙකත් සමකාලීනව පැවති ආගමික අදහස් වලට එරෙහි නොවූ හ. දාර්ශනිකව ඒවා විවේචනය කිරීම එරෙහි වීමත් නොවේ. බුදුරජාණන් වහන්සේ වෙනත් ආගම් කෙරෙහි ප්‍රතිචාර දැක්වූයේ,

(1) සියලු ආගමික මතවාද පිළිගනිමින් ය.

(2) සියලු මතවාද ඉවත දමමින් ය.

(3) විවේචනය කරමින් ගර්හාවට ලක් කිරීමෙන් ය.

(4) උපෙක්ෂාවෙන් හා සමානාත්මතාවයෙන් යුතු මැදුම් පිළිවෙතින් ය.

20. ''සමවායෝ එව සාධු'' යන පාඨයේ අදහස වන්නේ,

(1) ''සමඟියම යහපත්'' යන්න ප්‍රකාශ කිරීම සඳහා ය.

(2) ''සමඟි වන්න'' යන අදහස දීම සඳහා ය.

(3) ''විවාද නොකරන්න'' උපදෙස් දීම සඳහා ය.

(4) ''සමාජයේ ජීවත් වන්නේ'' අවවාදය දීම සඳහා ය.

21. මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ෂා යනු,

(1) සිවු සඟරාවත් ය. (2) සිවු බඹ විහරණ ය.

(3) චතුරාර්ය සත්‍ය ය . (4) සිවුරඟ සේනා ය.

22. ''භවත් ගෞතමයන් වහන්ස, මේ මිනිස් ලෝකයේ ජීවත්වන හැම දෙනාම එක සමාන නැහැ. සමහරුන්ට ආයුෂ අඩුයි. සමහරුන්ට වැඩියි.'' ආදී වශයෙන් ප්‍රශ්න කළ පුද්ගලයා වන්නේ,

(1) සුමන නම් මාලා කරුවෙක් ය. (2) මාගන්ධි නම් බමුණා ය.

(3) උපාලි නම් ගෘහපතියා ය. (4) සුභ නම් මානවකයෙක් ය.

23. කර්මය පිළිබඳ ප්‍රභේද රාසියක් බුදු දහමෙහි දක්වා තිබේ. විපාක දෙන කාලය අනුව කර්ම සතරාකාර ය. එම කර්ම ගනයට අයත් නොවන පිළිතුර තෝරන්න.

(1) උපපජ්ජවේදනීය කර්මය (2) අපරාපරීයවේදනීය කර්මය

(3) උපත්ථම්බක කර්මය (4) අහෝසි කර්මය

24. පඤ්චානන්තරීය පාපකර්ම හා නියත මිත්‍යා දෘෂ්ටිය අයත් වන්නේ,

(1) කටත්තා අකුසල කර්ම වලට ය. (2) ආචිණ්ණ අකුසල කර්ම වලට ය.

(3) ආසන්න අකුසල කර්ම වලට ය. (4) ගරුක අකුසල කර්මවලට ය.

25. අනුන්ගේ යහපත හා දියුණුව පිණිස කටයුතු කිරීම යනු,

(1) අර්ථචරියාවයි. (2) සමානාත්මතාවයි.

(3) පරාර්ථකාමී බවයි. (4) යහපාලනයයි.

26. රූපය ''පෙණ පිඬක්'' නම් වේදනාව උපමා කර ඇත්තේ,

(1) කොමඩු ගෙඩියක් ලෙස ය. (2) දිය බුබුළක් ලෙස ය.

(3) කළ ගෙඩියක් ලෙස ය.. (4) කෙසෙල් කඳක් ලෙස ය.

27. ''විභව තණ්හාව'' යනුවෙන් හැඳින්වෙන්නේ,

(1) පරලොවක් නැත යැයි විශ්වාස කිරීමයි.

(2) මෙළොව පරලොව දෙකම පිළිගැනීමයි.

(3) දිගින් දිගටම සසර සැපත විඳීමට ඇති ආශාවයි.

(4) මෙළොව වශයෙන් හැකිතාක් සැප විඳීමට ඇති ආශාවයි.

28. පඤ්ච ස්කන්ධය යනු,

(1) රූප, වේදනා, තණ්හා, උපාදාන, විඤ්ඤාණ ය.

(2) රූප, වේදනා, තණ්හා, උපාදාන, භව ය.

(3) රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ ය.

(4) රූප, වේදනා, සඤ්ඤා, විඤ්ඤාණ, නාමරූප ය.

29. උතුම් සත්‍ය හතරට අයත් නොවන පිළිතුර තෝරන්න.

(1) උත්තම ආර්ය සත්‍ය ය

(2) දුක්ඛ සමුදය ආර්ය සත්‍ය ය.

(3) දුක්ඛ නිරෝධ ආර්ය සත්‍ය ය.

(4) දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍ය ය.

30. බුදුරදුන්ගේ මංගල ධර්ම දේශනය සිදුකළ ස්ථානය ලෙස සැලකෙන්නේ,

(1) ජේතවනාරාමයේ දීය. (2) වේළුවනාරාමයේ දීය.

(3) පූර්වාරාමයේ දීය. (4) බරණැස ඉසිපතනාරාමයේ දීය.

31. පස්කම් සැපතින් නික්මීම ද, අනුන් නොනැසීම ද හිංසා නොකිරීම යනු,

(1) සම්මා දිට්ඨියයි. (2) සම්මා සංකප්පයයි.

(3) සම්මා වාචායි. (4) සම්මා කම්මන්තයි.

32. ''ඔබ වහන්සේ පැවිදි වූයේ කරවෙකු උදෙසා ද? ඔබ වහන්සේගේ ගුරුතුමා කවරෙක් ද? කාගේ දහමක් ද ඔබ වහන්සේ රුචි කරන්නේ?'' මෙලෙස ප්‍රශ්න කරන ලද්දේ කවරෙකු විසින් ද?

(1) උපතිස්ස පිරිවැජිතුමා විසිනි. (2) අස්සජි හිමියන් විසිනි.

(3) අනේපිඬු සිටුතුමා විසිනි. (4) ධම්මික උපාසකතුමා විසිනි.

33. අග්‍රශ්‍රාවක සැරියුත් මහ රහතන් වහන්සේ පළමුව පැවිදි වී සිටියේ කවර ගුරුවරයෙකු යටතේ ද?

(1) උරුවේල කාශ්‍යප ගුරුතුමා ලඟ ය. (2) නදී කාශ්‍යප ගුරුතුමා ලඟ ය.

(3) සංජය පිරිවැජිතුමා ලඟ ය. (4) උද්දකරාම ගුරුතුමා ලඟ ය.

34. ''අනිච්චාවත සංඛාරා - උප්පාද වය ධම්මිනෝ'' යන පාඨයේ අර්ථය වන්නේ,

(1) යමෙකුගේ ජීවිතය උපතින් ආරම්භ වේ යන්න ය.

(2) ජීවත්වන අය මරණය කරා පැමිණේ යන්න ය.

(3) ඇති වන සියල්ල නැති නොවේ යන්න ය.

(4) ඇති වී නැතිව යන බැවින් සංස්කාර ඒකාන්තයෙන් ම අනිත්‍යය වන්නේය යන්න ය.

35. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යනු,

(1) ත්‍රිවිද්‍යාවයි. (2) ත්‍රිශික්ෂාවයි.

(3) ත්‍රිලක්ෂණයයි. (4) ත්‍රිවේදයයි.

36. ශිෂ්‍යයෙකු විසින් ගුරුවරයාට පස් අයුරකින් සැලකිය යුතු බව බුදුරජාණන් වහන්සේ වදාළ හ. එම කරුණු අතරින් අදාල නොවන පිළිතුර තෝරන්න.

(1) මැනවින් ඉගැන්වීම.

(2) අවශ්‍ය උපස්ථාන කිරීම.

(3) අවශ්‍ය කටයුතු ඉටුකර දීම.

(4) අවවාද අනුශාසනාවලට මැනවින් ඇහුම්කන් දීම.

37. මේ භවයේ දැඩි ලෙස සත්ත්ව හිංසා කර, මරණාන්න මොහොතේ ඌරකු සේ කෑ ගසා දැඩි වේදනාවෙන් දුක් විඳ අපාගත වූ පුද්ගලයා වන්නේ,

(1) චුල්ල පන්ථක ය. (2) චුන්ද සූකරික ය.

(3) චුන්ද කර්මාරපුත්‍ර ය. (4) චූලෝදර ය.

38. මහා සෑය ලෙස හැඳින්වෙන චෛත්‍ය වනුයේ,

(1) ථූපාරාම චෛත්‍ය රාජයා ය. (2) මිරිසවැටි චෛත්‍ය රාජයා ය.

(3) ජේතවන චෛත්‍ය රාජයා ය. (4) රුවන්වැලි චෛත්‍යරාජයා ය.

39. ජලයේ පාසි ඇත්නම් ඒ තුළ කිසිවක් නොපෙනේ. එමෙන්ම සිතෙහි කයෙහි නිදිමත ගතිය උදාසීනකම පවතී නම් පාඩම් කළ දෙය මතකයට නොඑයි. ඒ නිදිබර බව උදාසීනකම හැඳින්වෙන්නේ,

(1) කාමච්ඡන්දය කියා යි. (2) ව්‍යාපාදය කියා යි.

(3) ථීනමිද්ධ කියා යි. (4) විචිකිච්ඡා කියා යි.

40. ගැබිනි මව්වරුන්ගේ ආරක්ෂාව, හාත්පස රැකවරණය ලබා දෙන විශේෂ පිරිත් දේශනාව වන්නේ,

(1) මහා මංගල සූත්‍රය (2) අංගුලිමාල පිරිත ය.

(3) කරණීය මෙත්ත සූත්‍රය ය. (4) රතන සූත්‍රය ය.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# දෙවන වාර පරීක්ෂණය 2018

**10 ශ්‍රේණිය** **බුද්ධ ධර්මය - II** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

---

(01) i. පස්වග තවුසන් අර්හත්බවට පත්වූයේ කවර සූත්‍ර දේශනාව ශ්‍රවණය කිරීමෙන් ද?

ii. බුදු දහමේ ඉගැන්වෙන ප්‍රධාන භාවනා ක්‍රම දෙක නම් කරන්න.

iii. ''යේ ධම්මා හේතුප්පභවා - තේසං හේතුං තථාගතෝ ආහ.

තේසං ච යෝ නිරෝධෝ - එවං වාදී මහා සමණෝ''

මෙම ගාථාවෙන් හෙළි කෙරෙන බුදු දහමේ ඉගැන්වෙන ධර්ම කරුණ කුමක් ද?

iv. බෝසත් උපත හා බැඳුණු අභියෝගාත්මක අවස්ථා දෙකක් නම් කරන්න.

v. විපාක දෙන කාලය අනුව කර්ම සතර ආකාර ය. ඒවායින් දෙකක් ලියන්න.

vi. බුදු දහමේ ඉගැන්වෙන සිව්වනක් පිරිස නම් කරන්න.

vii. බුදුරජාණන් වහන්සේ දේශනා කළ සිල් රැකීමෙන් ලැබෙන ආනිසංස පහෙන් දෙකක් ලියන්න.

viii. සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන භෝග විනාශයට හේතුවන කරුණු හයෙන් දෙකක් ලියන්න.

ix. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ප්‍රඥා කොටසට අයත් අංග දෙක නම් කරන්න.

x. සිව්පසය නම් කරන්න. (ලකුණු 20)

02. i. සිගාලෝවාද සූත්‍රයේදී දකුණට හා බටහිර දිසාවන්ට උපමා කරණු ලැබුවෝ කවුරුන් ද?

ii. ඉහත දැක්වූ එක් සමාජ කණ්ඩායමකින් සමාජයට විය යුතු යුතුකම් තුනක් දක්වන්න.

iii. සාර්ථක ගෘහ ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය පදනම සිගාලෝවාද සූත්‍රයෙන් පෙන්වා දී තිබේ. පැහැදිලි කරන්න. (ල. 02+03+05 = 10)

03. i. ''ආරභථ නික්ඛමථ'' යන ධම්ම පද ගාථාව සම්පූර්ණ කරන්න.

ii. එහි තේරුම ලියන්න.

iii. උත්සාහයෙන්, වීර්යයෙන්, නොපසුබස්නා බවෙන් යුතුව කටයුතු කිරීමෙන් යහපත් ප්‍රතිඵල ලබාගත හැක. අදාළ ගාථාව උපයෝගී කරගෙන විස්තර කරන්න. (ල. 02+03+05 = 10)

04. i. චතුරාර්ය සත්‍යය නම් කරන්න.

ii. චතුරාර්ය සත්‍යය ආර්ය සත්‍යයක් ලෙස දක්වයි. පහදන්න.

iii. ලෞකික ජීවිතයේ මුහුණ දෙන ගැටලු විසඳා ගැනීමේ මාර්ගයක් ලෙස චතුරාර්‍ය්‍ය සත්‍යය උපයෝගී කරගත හැකි අයුරු පෙන්වා දෙන්න. (ල. 02+03+05 = 10)

05. i. තිදොරින් කරන කර්ම දෙයාකාර ය. ඒවා මොනවා ද?

ii. වචනයෙන් සිදුවන කුසල කර්ම කීයද? ඒවා නම් කරන්න.

iii. අකුසලයෙන් වැළකී කුසලයෙහි යෙදීම දෙලොව ජීවිතය සාර්ථක කර ගැනීමට හේතු වේ. විමසන්න. (ල. 02+03+05 = 10)

06. i. බුදු දහමට අනුව පරිසරය බෙදිය හැකි කොටස් දෙක නම් කරන්න.

ii. බුදුරජාණන් වහන්සේ ස්වාභාවික පරිසරය දම් සභා මණ්ඩප බවට පත්කර ගත් අවස්ථා තුනක් නම් කරන්න.

iii. මිනිසාගේ පරම යුතුකම විය යුත්තේ ජීවී අජීවී පරිසරය ආරක්ෂා කර ගැනීමයි. බුද්ධ දේශනාවේ නිදසුන් ධර්ම කරුණු ද උපයෝගී කරගෙන මෙය විස්තර කරන්න.

(ල. 02+03+05 = 10)

07. පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට පමණක් කෙටි සටහන් ලියන්න.

i. දුටුගැමුණු රජතුමා

ii. විදර්ශනා භාවනාව

iii. අනුත්තර පුරිසදම්ම සාරථී ගුණය

iv. ත්‍රිලක්ෂණය (ල. 01x05x02 = 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(2) | 2 -(1) | 3 -(4) | 4 -(3) | 5 -(1) | 6 -(3) | 7 -(4) | 8 -(2) | 9 -(2) | 10 -(1) |
| 11-(4) | 12 -(3) | 13 -(2) | 14 -(1) | 15 -(4) | 16 -(2) | 17 -(3) | 18 -(3) | 19 -(4) | 20 -(1) |
| 21-(2) | 22 -(4) | 23 -(3) | 24 -(4) | 25 -(1) | 26 -(2) | 27 -(1) | 28 -(3) | 29 -(1) | 30 -(4) |
| 31-(2) | 32 -(1) | 33 -(3) | 34 -(4) | 35 -(3) | 36 -(1) | 37 -(2) | 38 -(4) | 39 -(3) | 40 -(2) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) i. අනන්ත ලක්ඛණ සූත්‍රය

ii. සමථ භාවනාව (චිත්ත භාවනා) විදර්ශනා භාවනාව (විපස්සනා, ත්‍රිලක්ෂණ, ප්‍රඥා)

iii. පටිච්ච සමුප්පාදය/ හේතුඵලවාදය/ හේතුඵල ධර්මය

iv.
- පංච මහා විලෝකනය මගින් පූර්ණ අධ්‍යයනයක් කිරීම.
- ඥාතීන් ඉදිරියේ ශිල්ප දැක්වීම.
- විවාහය සඳහා සුදුසු කුල කුමරිකාවක් තෝරා ගැනීම.
- අසන දකින දේ විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීම.
- ජීවිතයේ යථාර්ථයන්ට මුහුණ දීමට නොබියව ඉදිරිපත් වීම.
- කිසා ගෝතමියන්ගේ නිබ්බුත පද අසා ප්‍රසාදයට පත් කුමරු සිය මුතුහර තෑගි කිරීම.
- සත්‍යය හා කුසලය වෙනුවෙන් රජ සැප අත් හැරීම.

v.
- දිට්ඨධම්ම වේදනීය කර්මය
- උපපජ්ජවේදනීය කර්මය
- අපරාපරිය වේදනීය කර්මය
- අහෝසි කර්මය

vi. භික්ෂු / භික්ෂුණී / උපාසක / උපාසිකා

vii.
- මහත් වූ භෝග සම්පත් අත්පත් කර ගැනීම.
- කීර්තිය ලැබීම.
- ඕනෑම පිරිසක් මැදට නිර්භයව එළඹීමට හැකි වීම.
- සිහිමුලා නොවී කලුරිය කිරීම.
- මරණින් පසුව සුගතියෙහි උපත ලැබීම.

viii.
- මදයට හා ප්‍රමාදයට හේතුවන මධ්‍යසාර ගැනීම.
- නුසුදුසු වේලාවන්හි මංමාවත්වල සැරිසැරීම.
- නැටුම් ගැයුම් වැයුම් හි ලොල් බව.
- සූදුවෙහි යෙදීම.
- පවිටු මිතුරන් ඇසුර
- අලස කමින් කල් ගෙවීම.

ix සම්මා දිට්ඨි / සම්මා සංකප්ප

x.
- චීවර
- පිණ්ඩපාත
- සේනාසන
- ගිලාන ප්‍රත්‍යය

(ලකුණු 1 x 2 x 10 = 20)

(02) i. දකුණු දිසාව - ගුරු සිසු සබඳතා බටහිර දිසාව - අඹු සැමි සබඳතා

ii. දකුණු දිශාව - ගුරු සිසු සබඳතා
සිසුවාගෙන් ගුරුවරයාට ඉටුවිය යුතු යුතුකම්
1. දුටු විට හුන් අසුනින් නැගිනීම
2. අවශ්‍ය උපස්ථාන කිරීම
3. අවවාද අනුශාසනාවලට මැනවින් ඇහුම්කන් දීම.
4. අවශ්‍ය කටයුතු ඉටු කරදීම.
5. මැනවින් ඉගෙන ගැනීම.

## II කොටස - පිළිතුරු ඉතිරි කොටස

ගුරුවරයා විසින් සිසුන්ට ඉටුකළ යුතු යුතුකම්.
1. මැනවින් හික්මවීම.
2. මැනවින් ඉගැන්වීම.
3. දන්නා සියලු ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වීම.
4. තම මිතුරන්ට සිසුවා හඳුන්වා දීම.
5. ශිෂ්‍යයා ආරක්ෂා කර ගැනීම.

iii. සමාජයක වැදගත් ම ඒකකය වන පවුලේ ප්‍රධාන ම සාමාජිකයන් වන්නේ බිරිය හා සැමියා ය. පවුලේ පැවැත්ම රැඳී පවතිනුයේ බිරිඳ හා සැමියා අතර සම්බන්ධතාවය මත ය. පවුලේ සාමය, සමගිය, සතුට, දියුණුව හා දූ දරුවන්ගේ යහපත සැලසෙනුයේ පවුල් සංස්ථාවේ යහපැවැත්ම මතය. එය ගෘහ ජීවිතයේ සාර්ථකත්වයට හේතු වේ.

03. i. ආරහථ නික්ඛමථ - යුඤ්ජථ බුද්ධ සාසනේ
ධුනාථ මච්චුනෝ සේනං - නළාගාරංව කුඤ්ජරෝ (ල. 02)

ii. අරඹවු නික්මෙව් යෙදෙව් බුදු සසුන්හි දිනව් මරසෙන් පරදා බට කැලයට වැදි ඇතෙකු සේ. (ල. 03)

iii. උත්සාහවන්ත වූ, මනා සිහි ඇතිව, නිවැරදි දෙය පරීක්ෂාකාරීව කරන හික්මීමෙන් යුතුව ඉදිරි දැක්මන් යුතුව මෙහෙවර කිරීම තුළින් බලාපොරොත්තුවන අභිලාෂයන් කරා ළඟා විය හැක. මෙම කරුණු ඇතුලත්ව පිළිතුර ගොඩනගා ඇතිනම් සම්පූර්ණ ලකුණු දෙන්න. (ල. 05)

04. i. චතුරාර්ය සත්‍යය

| | |
|---|---|
| i. දුක්ඛ ආර්ය සත්‍යය | ii. දුක්ඛ සමුදය ආර්ය සත්‍යය |
| iii. දුක්ඛ නිරෝධාර්ය සත්‍යය | iv. දුක්ඛ නිරෝධ ගාමිනි පටිපදා ආර්ය සත්‍යය. |

(ල. 02)

ii. ශ්‍රේෂ්ඨ, උතුම්, උතුම් සත්‍යය යනු එහි අදහසයි. රාග, දෝෂ, මෝහ ආදී සියලු කෙළෙස් මුලිනුපුටා දමා ආර්‍ය භාවයට පත් කරන නිසා මෙම ධර්ම ආර්‍ය සත්‍යය ලෙස හැඳින්වේ. එසේම බුද්ධා දී උතුමන් සේවනය කරන නිසා ද, නිවන් අවබෝධ කරන නිසා ද, මෙම නාමයෙන් හැඳින්වේ. (ල. 03)

iii. පුද්ගලයෙකුගේ ලෞකික ජීවිතයට සෘජුව අදාල කරගත හැකි ධර්මතාවයක් ලෙස චතුරාර්‍ය සත්‍ය හැඳින්විය හැකි ය. අප ජීවත්වන කාල සීමාව තුළ මුහුණ දෙන ගැටලු විමසීම, විසඳා ගැනීම සඳහා චතුරාර්‍ය සත්‍යය ඉවහල් කරගත හැකි ය. (ල. 05)

05. i. කුසල කර්ම හා අකුසල කර්ම (ල. 04)

ii. හතරකි.
- බොරු නොකීම (මුසාවාදා වේරමණී ... )
- කේළාම් නොකීම (පිසුණාවාචා වේරමණී ... )
- පරුෂ වචන නොකීම (පරුෂාවචා වේරමණී ... )
- හිස් වචන නොකීම (සම්පප්පලාපා වේරමණී ... )

iii. අකුසලයෙන් වැළැකී කුසලයෙන් යුතුව ජීවිතය දෙලොව ජීවිතය සාර්ථකවීමට හේතු වේ.
(සබ්බ පාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා)
චුල්ල කම්ම විභංග සූත්‍රයට අනුව කර්ම රැස්කර ගැනීමෙන් මෙලොව වශයෙන් හා පරලොව වශයෙන් ප්‍රතිවිපාක ලැබේ. කුසල කර්ම කිරීමෙන් යහපත් කුසල විපාක ලැබේ. ඒවා සාර්ථක ජීවිතයක් පවත්වා ගැනීමට හේතු වේ. (ල. 05)

06. i. ජීව - අජීව

ii.
- ඉසිපතනයේ මිගදායේ
- ගිජ්ජකූට පර්වතයේ සූකරකත ලෙනේ
- ඉච්ඡානංගල වනයේදී අම්බට්ඨ සූත්‍රය
- අචිරවතී නදී තිරයේ අඹ වනයේදී තේවිජ්ජ සූත්‍රය
- විශාලා මහනුවර වනයේදී මහා සිහනාද සූත්‍රය දේශනා කිරීම. (ල. 03)

## II කොටස - පිළිතුරු ඉතිරි කොටස

iii. 10 ශ්‍රේණිය බුද්ධ ධර්මය පෙළපොතේ බුදු සිරිතයි පරිසරයයි 16 පාඩම පිටු 88 - 93 දක්වා ඇති පිළිතුරු සලකා බලා ලකුණු දෙන්න. (ල. 05)

07. i. දුටුගැමුණු මහරජතුමා

මාගේ මේ ව්‍යායාමය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස මිස කිසි කලෙක රජ සැප පිණිස නොවේය යන්න දුටුගැමුණු රජතුමාගේ පරමාදර්ශය විය. විදේශීය ආක්‍රමණයෙන් රට, ජාතිය, බුදු සසුන බේරා ගැනීමට ශ්‍රේෂ්ඨ මෙහෙවරක් ඉටු කරන ලදී. රුවන්වැලි සෑය, ලෝවාමහපාය, මිරිසවැටිය එතුමාගේ විශාල ශාසනික මෙහෙවරයන් ය. තමා කරන ලද සියලු පුන්‍ය ක්‍රියා පිං පොතකට ඇතළත් කරන ලදී. එසේම වසර 24ක් රාජ්‍ය වෙසක් උත්සවයන් ද සිදු කළේ ය. (ල. 05)

ii. විදර්ශනා භාවනාව

ආධ්‍යාත්මික දියුණුව මත පිහිටි සසර දුකට මුලවන රාගාදී කෙලෙස් මුල් උදුරා දමන නුවණ ලබාගත යුතු ය. එය විපස්සනා ඥානය නම් වේ.

විපස්සනා හෙවත් විදර්ශනා යන්නෙහි අදහස වන්නේ මනා නුවණින් විශේෂයෙන් දැකීමයි. එනම් ඇත්ත ඇති සැටියෙන් දැකීමයි.

''විසේසේන පස්සතීති විපස්සනා''

විශේෂ වශයෙන් බලයි, දකියි යන තේරුමින් විපස්සනා යයි කියනු ලැබේ. (10 ශ්‍රේණිය 05 වන පාඩම බලන්න)

(ල. 05)

iii. අනුත්තර පුරිස දම්ම සාරථී ගුණය.

පුරිස දම්ම සාරථී ගුණය යනු දමනය කළ නොහැකි පුද්ගලයන් හික්මවීම ය. බුදුන්වහන්සේ විසින් අංගුලිමාල, ආලවක, සුචිරෝම, ඛරරෝම ආදීන් දමනය කිරීමෙන් පෙනේ. මෙම ගුණය ගුරුළුගෝමි පඬිතුමා විසින් අමාවතුර ග්‍රන්ථයේදී වඩාත් විස්තර කෙරේ. (ඉහත කරුණු ඇතුළත් ව පිළිතුරු සපයා ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.) (ල. 05)

iv. ත්‍රිලක්ෂණය

ත්‍රිලක්ෂණය බුදු දහමේ මූලික ඉගැන්වීමකි. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යනු ත්‍රිලක්ෂණයන් ය. ලෝකයේ යථා ස්වභාවය අවබෝධ කරගත හැකි වීම. අකම්පිත වීම, සමබර පෞරුෂයක් ලැබීම, උපේක්ෂාවෙන් ක්‍රියා කිරීම තිලකුණු වඩන්නා තුළ දැකිය හැකි ය. නිර්වාණාවබෝධය ලැබීමට තිලකුණු ඉවහල් වේ. ත්‍රි ලක්ෂණ භාවනාව විදර්ශනා, විපස්සනා, ප්‍රඥා භාවනාව ලෙසින් ද හඳුන්වයි. 10 බුද්ධ ධර්මය 74 සිට 76 දක්වා පිටු. ඉහත කරුණු දක්වා ඇති නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න. (ල. 05)